# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVI    YEAR OF OUR LORD JESUS CHRIST, OCTOBER 2022    Issue No. 11


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 73:1-10)**

01. සැබවින්ම දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට, එනම් පිරිසිදු සිත් ඇත්තන්ට, යහපත්ය.

02. එහෙත් මාගේ පාද ඉවතයන්ට ළං විය, මාගේ අඩි නොලිස්සුවා පමණය.

03. මක්නිසාද මම දුෂ්ටයන්ගේ අභිවෘද්ධිය දුටු කල, අහංකාරීන් කෙරෙහි ඊර්ෂ්‍යාකළෙමි.

04. මක්නිසාද ඔවුන්ගේ මරණයේදී වේදනා නැත. ඔවුන්ගේ ශක්තිය ස්ථිරය.

05. වෙන මනුෂ්‍යයන්ට මෙන් ඔවුන්ට විපත්ති නැත. වෙන මනුෂ්‍යයන්ට මෙන් පීඩා නැත.

06. එබැවින් ආඩම්බරය ඔවුන්ගේ බෙල්ලේ මාලාවක් මෙන්ය, බලාත්කාරය වස්ත්‍රයක් මෙන් ඔවුන් සරසයි.

07. ඔවුන්ගේ ඇස් තරකමින් නෙරා තිබේ. ලබන්ට ආශාවෙනවාටත් වඩා ඔවුන්ට සම්පත් ඇත.

08. ඔව්හු ගර්හාකෙරෙති, දුෂ්ටකමින් බලාත්කාරය ගැන කථාකෙරෙති. උඩඟුලෙස කථාකෙරෙති.

09. ඔව්හු තමුන්ගේ මුඛය අහසෙහි තබා තිබේ, ඔවුන්ගේ දිවද මුළු පොළවෙහි සංචාරය කරයි.

10. එබැවින් උන්වහන්සේගේ සෙනඟ මෙතැනට හැරී එති. පිරුණු කුසලානකින් ඔව්හු වතුර බේරා බොති.

# අභිලාශයක් ඇති පුද්ගලයෙකු ලෙස ඔබ වෙනස් වෙන්න.

CHANGE AS GOAL ORIENTED PERSON!

## The ambition of the goal oriented person is greater than his life!

*(Message delivered by Pastor S. Sam Selva Raj at the Main Church)*

අද ලෝකයෙහි බොහෝ දෙනා යම් අරමුණක් හෝ අභිලාශයක් ඇතිව ජීවත් වෙති. අප කිතුණුවන් ලෙස මේ ලෝකය තුළ අරමුණක් හා අභිලාශයක් ඇතිව ජීවත් වීම පමණක් නොව අපගේ ආත්මික ජීවිතය තුළද අභිලාශයක් ඇතිව ජීවත් විය යුතුය. ආත්මික ලෙස මෙවැනි ජීවිතයක් ගත කිරීමට නම් යම් කෙනෙක් ඔහු ආත්මික ලෙස ඉතා ශක්තිමත් අත්තිවාරමක් ඔහුගේ ජීවිතයෙහි දැමිය යුතුය. යම් පුද්ගලයෙකුට ආත්මික ලෙස අභිලාශයක් නැතිනම් ජයග්‍රාහී ජීවිතයක් ගතකල නොහැකිය.

යම් පුද්ගලයෙකුගේ ජීවිතයෙහි විශේෂ දෙයක් ලබා ගැනීමට කැමැත්තක් තිබේ නම් ඔහු ස්වාධීනව සිතිය යුතුය. විටෙන් විට අවස්ථාවෙන් අවස්ථාවට ඔහුගේ අභිලාෂයන් වෙනස්කර ගැනීමට නුසුදුසුය.

අප විශ්වාස කරන්නාවූ දේ පිළිබඳව අපට පැහැදිලිතාවයක් නොමැතිනම් අපට සාර්ථක ජීවිතයක් ගත කිරීමට නොහැකිය. දර්ශනයක් ඇති පුද්ගලයා ඉතා ශක්තිමත් ආත්මික ජීවිතයක් ගත කරයි. නිතරම තමාගේ අදහස්, අභිලාශයන් තමාගේ පහසුව සඳහා වෙනස් කරන්නාවූ තැනැත්තාට ඉතා සාර්ථක වූ ජීවිතයක් ගත කිරීමට නොහැකිය. තමාගේ තීරණය තුල ස්ථිරව සිටින්නාවූ තැනැත්තාට මහත්වූ නායකත්වයකට ප්‍රවිශ්ඨවීමට පුළුවනි. දේව වචනයෙහි මෙසේ සඳහන්ව ඇත. ***''ඔහු දෙසිත් ඇති මනුෂ්‍යයෙක්ව තමාගේ සියලු මාර්ගවලදී අස්ථිරව සිටින්නේය.''*** *(යාකොබ් 1:8)*

### (1). දෙවියන්වහන්සේට නමස්කාර කිරීමටත් සේවය කිරීමටත් අභිලාශයක් ඇති පුද්ගලයින්

***යොෂුවා 24:15 හි මෙසේ පවසයි. ''....ස්වාමීන්වහන්සේට සේවය කිරීමට නුඹලාට නරකව පෙනේනම්, ... නුඹලා සේවයකරන්ට කැමති කාටද කියා අදම තෝරාගනිල්ලා. එහෙත් අපි නම්, මමද මාගේ පවුලද ස්වාමීන්වහන්සේට සේවය කරමු.''*** යනුවෙනි. මෙහිදී යම් කිසි ප්‍රශ්නයක් පැන නැගී ඇත. එනම්, ***'නුඹලා සේවය කරන්නේ කාටද?'*** යනුවෙනි. අප සියල්ලෝමද යේසුස්වහන්සේට සේවය කරන නුමුත් අප පුද්ගලිකව යේසුස්වහන්සේට සේවය කරනවාද?

*3 වෙනි පිටුවට ...*

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

*from your dearly beloved brother...*




# කැඳවීමේ ප්‍රතිරාවය



*Pr. Sam Selva Raj with daughter Angeline and son Alex*

**"නුඹෙන් අහක්ව නොයන්නෙමි. නුඹ අත් නාරින්නෙමි."**
**(යොෂුවා 1:5)**

## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.



*Nehemiah Bible College*

**ප්‍රේමණීය මිත්‍රයෙනි,**
**අපගේ ස්වාමිවූ විශ්වයේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත් නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙනෙමි.**

ස්වාමීන්වහන්සේ තුළ ප්‍රේමවන්තයෙනි,
ස්වාමීන්වහන්සේ තුළ ප්‍රේමණීය සහෝදර සහෝදරිය, අපි ස්වාමීන්වහන්සේට ස්තුතිවන්ත වෙනවා උන්වහන්සේ අපිට කලාවූ සියලුම අනර්ඝ ආශිර්වාද නිසා ඒවාගෙම උන්වහන්සේගේ වචනය මේ ලෝකයට දෙන්න පුළුවන් වීම ගැන දෙවියන්වහන්සේ ස්තුති වන්ත වෙනවා. ඔබ සැම දෙනාගේ ප්‍රේමය, සැලකීම සහ සියලු උපකාර නිසා අපි ස්තුති වන්ත වෙනවා.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව කරණකොටගෙන අපේ සියලුම වැඩ කටයුතු නැවත පටන් ගත්තෙමු. අපි පවත්වාගෙන යන පෝල් මෙට්‍රික්යුලේෂන් පාසලට අලුතින් සේවය කරන්න ඉතා හොඳ බුද්ධිමත් අය අපිට ලැබී තියෙනවා. නෙහෙමියා බයිබල් විදුහල ඉතා හොඳින් ක්‍රියාකරගෙන යන්නෙමු. 15 දෙනෙක් ගෙන් සමන්විත ධර්මාචාර්‍යය සඳහා අධ්‍යාපනය ලබන්නෙමු. තරුණ තරුණියන්ට ඉතා හොඳ පුහුණුවක් එම ස්ථානයේදී ලබා දෙනවා ඇත. ඒවාගේම ඊළඟ පරම්පරාව වෙනුවෙන් අපි කරන්නාවූ තැපැල් මාර්ග පාඩම් මාලාව හොඳින් කරගෙන යාමට දෙවියන්වහන්සේ ගේ කරුණාව ලැබී තියෙනවා.




*St. Paul's Matriculation School*

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව භාෂා 16 කින් නිකුත් කිරීම 40 දෙනෙක්ගෙන යුතු ඉතා දක්ෂ දේව දාසයන් අපිට උපකාර කරන නිසා අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු.



අපේ ප්‍රධාන කාර්යාලයෙත්, මුද්‍රණාලයත් සේවය කරන්නාවූ ඉතා කඩිසර දේව දාසයන් නිසා ස්තුති කරනවා,



*Sunday Church Services*

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran
Dr. A. Richard Samuel, M.A., Ph.D.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858
CORE LEADERS
Bro. K. Puratchivendan
Bro. A. Edward Durai
Bro. A. Alvin
Bro. K. Abraham
Sis. Dhanalakshmi Chinnaiah
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

දෙවියන්වහන්සේගේ සේවය තවත් ඉදිරියට කරගෙන යාමට අපට සේවය කරන්න කණ්ඩායමක් අවශ්‍ය වී තිබෙනවා. මේ ගැන යාච්ඤා කරන්න. සෑම ඉරිදාවකම උදෑසන 5.30 සිට රාත්‍රී 8.00 දක්වා දෙමළ, ඉංග්‍රීසි. තෙලිඟු සහ හින්දි භාෂා වලින් දේව මෙහෙයන් 6 ක් ප්‍රධාන සභාවේ පවත්වනවා. කවද අපේ ශාඛා සභාවෙන් සේවය කරන අයද ඔවුන් ඉන්න පළාත් වල ඒ ඒ භාෂාවන් වලින් හොඳින් සේවය කරමින් සිටිනවා.



Rev. Sam Selva Raj &
Rev. Nayan Ranjan Beero

අපේ ප්‍රධාන සභාවේ සේවක කණ්ඩායම ළමා සේවය නිසා විවිධ පළාත් වලට යමින් සේවය කරනවා. 2022 අගෝස්තු 31 වෙනිදා උදේ සිට සවස දක්වා අපි තරුණ තරුණියන්ට විශේෂ වැඩසටහනක් තැබුවා, දේවගැති සනිප්‍රසාද් බැංගලූර් වල සිට ඇවිත් මේ අයට සේවය කලා. තවද දේවගැති නායන්රංජන් වීරෝ කුජාරන් සිට ඇවිත් විශේෂ පාඩම් මාලාව, 2022 අගෝස්තු මස 15 සිට 20 දක්වා අපේ බයිබල් විදුහලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පැවැත්වුවා. ඔබගේ යාච්ඤාව අපට ඉතාම අවශ්‍යයි. ඉන්දියාව පුරා ශුභාරංචිය ගෙන යන පිණිස අපිද ඔබලා උදෙසා යාච්ඤා කරනවා. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සෑම්සන් සෑම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

## *1 පිටුවෙන්....*

යෝෂුවාගේ ජීවිතය දෙස බල විටදී යෝෂුවා 24 වන පරිච්ඡේදය ඔහු විශාල අභියෝගයන් වලට මුහුණ දුන්නේය. දෙවියන්වහන්සේ යෝෂුවාට කථාකොට ''මම මිසරයෙන් ඉශ්‍රායෙල් සෙනඟව පිටතට ගෙනාවෙමි. මම ඔවුන්ට ආශිර්වාද කලේය. පටන්ගැන්මේ සිටම මම මාගේ නාමය ඔවුන්ට දුනිමි. එවිට ඔවුන් උදවු ඉල්ලා මට මොරගැසුවේය. මම ඔවුන් සමඟ සිටිමින් ඔවුන්ව පෝෂනය කලෙමි. සියලුම අන්ධකාරයන්ගෙන් ඔවුන්ව නිදහස් කරමින් රතු මුහුද දෙබෑකර ඒ මැදින් මා ඔවුන්ට මාර්ගයක් සාදා එයින් ගෙනාවෙමි. මිසර හමුදාව ඔවුන් පසුපස ලුහුබැඳ පැමිණෙන විටදී ඔවුන්ව මා විනාශකර ඉශ්‍රායෙල් සෙනඟව ආරක්ෂා කලෙමි. මේ සියලුම කාරණා යෝෂුවා සෙනඟට මතක් කර දෙමින් මේ ප්‍රශ්නය ඔවුන්ගෙන් අසයි. ***නුඹලා සේවය කරන්නේ කාටද?''***

ස්වාමීන්වහන්සේට සේවය කරන පිණිස අප තුළ අභිලාශයක් තිබිය යුතුය. යේසුස්වහන්සේට සේවය කරන පිනිස අප තුළ එළිදරව්වක් හා අභිලාශයක් තිබිය යුතුය. අද කාලය තුළ ඉතාම දුකට පත්වන කාරණයක් නම්, මනුෂ්‍යයා තමාගේ කැමැත්ත ප්‍රකාරයට තමාට පහසුව ගෙනෙන ආකාරයට සියලුම දේ තමා වෙනුවෙන් වෙනස්කර ගෙන ඇත. ඔවුන්ගේ දර්ශනය තුළ ඔවුන් ස්ථිරව නොමැති නිසා, ප්‍රශ්නයක් පැනනැගෙන විටදී ඔවුන් පරාජයට පත්වෙති.

යෝෂුවා පවසන්නේ ***''මමද මාගේ පවුලද ස්වාමීන්වහන්සේට සේවයකරමු''*** යනුවෙනි. සෙනඟද ඔහුට පිළිතුරු දෙමින්, ''දෙවියන්වහන්සේව අමතක කර උන්වහන්සේගෙන් ඈත්වීමත් අන් දෙවිවරුන් නමස්කාර කිරීමත් අපගෙන් දුරුවේවා'' කියා පවසයි. අප බොහෝ සෙයින් ප්‍රේම කරන්නාවූ තැනැත්තාට අප නමස්කාර කරමු. දෙවියන්වහන්සේගේ දරුවන් උන්වහන්සේට පමණක් නමස්කාර කරයි කියා උන්වහන්සේ බලාපොරොත්තු වෙති. කාලයෙන් කාලයට තමාගේ ඇදහිල්ල, නමස්කාරයන් හා විශ්වාසයන් වෙනස් කරන්නාවූ අය ගැන උන්වහන්සේගේ සතුට උන්වහන්සේ ප්‍රකාශ කරන්නේ නැත. ආත්මික දර්ශනයක් ඇතිව ඒ අනුව ජීවිත ගතකරන්නාවූ අය කෙරෙහි උන්වහන්සේ ප්‍රිය වන අතර ඔවුන්ට උන්වහන්සේ ආශිර්වාද කරයි. අද බොහෝ දෙනා තමාගේ ජීවිතයෙහි තිබෙන වාතාවරණයන්ට අනුව උන්වහන්සේට නමස්කාර කරයි. හැම විටම ඔවුන් නමස්කාර කරන්නේ නැත. බොහෝ දෙනෙක් යේසුස්වහන්සේට අනුගමනය කිරීමට කැමති නමුත් ඔවුන් වටා තිබෙන සමාජය එයට අකමැති වෙති. ඔබ උන්වහන්සේ තුළ සිටිනවා නම් උන්වහන්සේ ඔබට පවසන්නේ, 'උන්වහන්සේ තම දරුවන්ව අමතක නොකරයි' යනුවෙනි. තවද එම තැනැත්තාගේ පවුලද ගලවන බවට පවසයි. ***''....ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගනින්න, එවිට නුඹ ගැලවෙන්නෙහිය, නුඹද නුඹේ ගෙයි වැසියෝද එසේමය.'' (ක්‍රියා 16:31)*** දේව වචනය තුළ පවුල තුළ එක් පුද්ගලයෙකු ගැලවීම ලැබූ වට මුළු පවුලම ගලවන බවට උන්වහන්සේ පොරොන්දු වී ඇත. යේසුස්වහන්සේව අනුගමනය කරන්නාවූ කිසිවෙක් නොමගට ගොස් නැත. දෙවියන්වහන්සේ මේ මුළු පොළෝතලය පුරා විසිරී සිටින්නාවූ සෙනඟද උන්වහන්සේව දැනගැනීමේ දැනගැන්මට පැමිණ සිටිති.

අපි සියල්ලෝම දෙවියන්වහන්සේට සේවය කරමු. අප සියලුම දෙනාම එක පවුලක් ලෙස බලවත් අභිලාශයක් ඇතිව ස්වාන්මිවහන්සේට සෑමදාම සේවය කරමු.

ඔබ රහසිගත කිතුණුවෙක් නම් ඔබ ක්‍රිස්තුස්වහන්සේ ගැන කිසිවෙකුට ප්‍රකාශ නොකරයි. දැන් ඒ සඳහා කාලය පැමිණ ඇත. ඔබට නිර්භීතව නැගී සිටින්නය කියා යේසුස්වහන්සේ පවසයි. ***''එබැවින් මනුෂ්‍යයන් ඉදිරියෙහිදී, ඔහු අඳුනමියි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ ඉදිරියෙහිදී මමත්, ඔහු අඳුනමියි කියන්නෙමි.'' (මතෙව් 10:32)***

ඔබ නිතරම භයෙන් ජීවත්වීම දේව වචනය අනුමත නොකරයි. අපගේ යාච්ඤාව ස්වර්ගයෙහි සිටින ස්වාමීන්වහන්සේ වෙතට යනවා නම්, අපගේ ජීවිතය තුළ ස්වාමීන්වහන්සේ කල දේ අප ප්‍රසිද්ධව ප්‍රකාශ කල යුතුය. අප යේසුස්වහන්සේ උදෙසා නිර්භීතව ජීවත්විය යුතුය. දේව වචනය තුල බලන විටදී යෝෂුවා බයිබලය තුල ඉතිහාසගත චරිතයකි. ඔහුගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේ බොහෝ දේ කර ඇත. ඔහු එම කිසිවක් අමතක නොකර ස්වාමීන්වහන්සේ ප්‍රසන්නවූ ජීවිතයක් ගත කිරීමට සමාජය අපොහොසත් වූ විටදී ඔහු ඉතා නිර්භීතව හා ධෛර්‍යයමත් ලෙස ඔහුගේ ස්වාමීන්වහන්සේ ඉදිරියෙහිත් ඔහුගේ සෙනඟ ඉදිරියෙහිත් ස්වාමීන්වහන්සේ උදෙසා සිටගෙන ජයග්‍රාහී කිතුණු ජීවිතයක් ගත කලේය. ඔබගේ ජීවිතයෙහිත් ඔබ ස්වාමීවූ යේසුස්වහන්සේට නමස්කාර කිරීමට අභිලාශයක් ඇති පුද්ගලයෙක් නම් ඔබගේ ජීවිතයේ වාතාවරනය කෙසේ තිබුණත් ඔබ ඒ තුළ ස්ථිරව සිටී නම් ඔබ ඔබගේ ජීවිතය තුළ සාර්ථක වනු ඇත.

## (2). අභිලාශයක් ඇති පුද්ගලයා දෙවියන්වහන්සේටත් උන්වහන්සේගේ සභාවටත් මුල් ස්ථානය දෙයි.

දේව වචනය මෙසේ පවසයි. ***''නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා, මේ සියල්ලන් නුඹලාට දෙනු ලබන්නේය.'' (මතෙව් 6:33)*** යේසුස්වහන්සේ පවසන්නේ, අප දේව රාජ්‍යය පළමුකොට සෙවිය යුතු බවයි. නමුත් අද මනුෂ්‍යයා සොයනු ලබන්නේ මුදල්ය. සෑම සතුටම ගෙන දිය හැක්කේ මුදල් වලට පමණක්මය කියා ඔබද සිතයි. නමුත් දේව වචනය පවසන්නේ, ඊට හාත්පසින්ම වෙනස්වූ දෙයකි. ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට අයිති කාරණාවන්හි යෙදෙන කල්හි ඔබට අවශ්‍ය සියලුම ආශිර්වාද ඔබ අනුව එනු ඇතැයි කියාය. අප අපගේ අවශ්‍යතා ගැන, ලෝකයේ ආශිර්වාදයන් ගැන කනස්සල්ලට පත්වන විටදී යේසුස්වහන්සේ අපට පවසන්නේ, 'මද ඇදහිල්ල ඇත්තෙනි' කියාය.

අප අපගේ ජීවිතයෙහි සියලු කාරනාවන් ගැන කනස්සල්ලට පත්වීම අවශ්‍ය නැත. කෑම ගැන, ඇඳුම් පැළඳුම් ගැන ලෝකයෙන් අපට අවශ්‍ය අවශ්‍යතා ගැන අප කනස්සල්ලට පත්වීම අවශ්‍ය නැහැ කියා යේසුස්වහන්සේ පවසයි. තවද කෙතේ තිබෙන මල් සැරසීමටත් අහසේ පියාඹන කුරුල්ලන්ට කෑම දීමටත් දෙවියන්වහන්සේ පුළුවන් නම් අපගේ අවශ්‍යතා සැපයීමටත් උන්වහන්සේට පුළුවනි. එසේ නම් අප ඔබ කනස්සල්ලට පත් වෙන්නේ මොනවා ගැනද?

අප කනස්සල්ලට පත්විය යුත්තේ උන්වහන්සේගේ රාජ්‍යය සෙවීමට හා උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සෙවීමටය. නමුත් අද කිතුණුවන් ලෝකයෙහි ඇති ආශිර්වාදයන් සොයමින් දේව රාජ්‍යයේ කාරණාවලට වඩා ලෝකයෙහි දේ වලට මුල් තැන දෙති. දේව රාජ්‍යය හා ධර්මිෂ්ඨකම සෙවීම ඔවුන් දෙවනුවට දමා ඇත. එබැවින් එක් දෙයක් ඔවුන් මතක තබා ගත යුතුයි. එනම්, මෙලෙස කිරීම නිසා ඔබ දැනටමත් පරාජයට පත් වී ඇති බවයි.

සහෝදර සහෝදරයෙනි ඔබ කලකිරීමට පත්වී පරාජයට පත්ව සිටිනවාය කියා ඔබ සිතනවාද? එසේනම් ඔබගේ මුළු පවුලම එකට එකතු වී යාච්ඤා කරන්න. ඔබගේ සියලුම බර, කරදර, වේදනා හා කස්සල්ල උන්වහන්සේ ඉවත්කර ඔබටත් ඔබගේ දරුවන්ටත් ආශිර්වාද කරන සේක. ඔබගේ දරුවන්ට හොඳ අනාගතයක් තිබේ.

ඔබගේ යෞවන කාලයේ සිටම ඔබ යේසුස්වහන්සේ උදෙසා යහපත ජීවිතයක් ගත කිරීමට ඕනය කියා තීරණය කලා නම් ඔබ මහළු වයසට ගිය විටදී නැවත හැරී 'සැබවින්ම මා

***6 වෙනි පිටුවට....***

**Pray for NEHEMIAH BIBLE**
**RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years
**Certificate in Theology : One year**
**Diploma in Theology : Two years**
Qualification : 10th Standard & above
**Rush for admission!**
**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

# GREAT COMMISSION PARTNERS

TO SHARE (Galatians 6:2) SUPPORT (Romans 12:13) SPEED UP (II Timothy 1:6)

PRAISE & PRAYER POINTS - From 2022 October 19 To November 18

(Please take this sheet out, fold it and keep it in your Bible and pray continuously)

## ✞PRAISE GOD FOR...

**October 19** ⇨ Graciously helping us to enter unreached areas with the Gospel.

**October 20** ⇨ His blessing to our Main & Branch Churches with more believers.

**October 21** ⇨ His blessings for the Men's Meeting in our Main Church.

**October 22** ⇨ His blessings for our publications in 16 languages which are printed in our Printing Press and sent to mission fields..

**October 23** ⇨ Our **St. Paul's Matriculation School, Nehemiah Bible College** and **Theological Correspondence Courses**.

**October 24** ⇨ Our Women's Meeting in our Main Church.

**October 25** ⇨ Enabling us to conduct Theological Seminars regularly.

**October 26** ⇨ His blessings on our commit ment to Magazine Ministry since 1969.

**October 27** ⇨ His blessings showered upon the families of our workers.

**October 28** ⇨ His mercy towards our Prayer Partners, Subscribing Partners, Faith Partners, Life Partners and Great Commission Partners and their families.

**October 29** ⇨ His gracious blessings to enter into the 54th year of **Echo of His Call Ministries** .

**October 30** ⇨ Helping us to conduct the convention programme to mark our entry into the 54th year.

**October 31** ⇨ Enabling us to support other ministries also.

**November 01** ⇨ For meeting all our financial and spiritual needs of last month.

**November 02** ⇨ The activities of our **Echo of His Call Ministries** in the last month.

**November 03** ⇨ The abundant blessings for our Pr. S. Sam Selva Raj and family.

## ✞PLEASE PRAY FOR ...

**November 04** ⇨ Our Associate Editors and their family members.

**November 05** ⇨ Our Partners and their family members.

**November 06** ⇨ Our sister Jesy Veena Sam Selva Raj who is again not well.

**November 07** ⇨ The success of our Senior Pastor in writing his autobiography.

**November 08** ⇨ All the Christian Organizations and Missionaries.

**November 09** ⇨ The eradication of Corona Virus from all the countries of the world.

**November 10** ⇨ Peace all over the world.

**November 11** ⇨ God's protection from the violence against women and children.

**November 12** ⇨ Providing necessary funds for **Echo of His Call Ministries** this month.

**November 13** ⇨ The blessing and protection upon all Christian Organisa-tions and Churches.

**November 14** ⇨ The unity and progress of our nation in all aspects .

**November 15** ⇨ Enlightening the eyes of all believers' hearts.

**November 16** ⇨ Our **Nehemiah Bible College** students and their studies.

**November 17** ⇨ Our **St. Paul's Matriculation School** to have more students for admission this year.

**November 18** ⇨ The safety of our Senior Pastor S. Sam Selva Raj and his family members.

4 පිටුවෙන්....

ජයග්‍රාහී ගත කලා' කියා පැවසීමට හැකිය. දෙවියන්වහන්සේට භයවෙන්නාවූ පුද්ගලයාට උන්වහන්සේගේ පොරොන්දුව ඉටු කිරීම ගැන දේව වචනයෙහි මෙසේ පවසයි. ***''මක්නිසාද නුඹ නුඹේ අත් වැඩේ ඵල කන්නෙහිය...'' (ගීතාවලිය 128:2)*** ඔබත් ඔබගේ ජීවිතයෙහි මෙවැනි ආශිර්වාද ලැබීමට නම් පළමුව දෙවියන්වහන්සේගේ රාජ්‍යය සොයන්න.

ඔබ කිසි දෙයක් ගැන ලෝකාකාර ලෙස බලා නොසිට ඔබගේ මුළු හදවතින්ම ස්වාමීන්වහන්සේට සේවය කරනවා නම් දෙවියන්වහන්සේ ඔබ ගැන ප්‍රසන්න වී ඔබට ආශිර්වාද කරයි . ඔබට තිබෙන්නාවූ සේවය හෝ වෙනත් දෙයක් වීමට හැක. එය කුඩා හෝ මහත් දෙයක් වීමට පුළුවනි. ඔබ සතුටු සිතින් එය පිලිගෙන ඔබේ මුළු හදවතින්ම එම සේවය කරනවා නම් එහි සම්පූර්ණ ආශිර්වාදය ඔබට ගෙන දෙනු ඇත. මේ ලෝකය තුලදීම දෙවියන්වහන්සේ ඔබට සනසයි. නිසි වේලාවට උන්වහන්සේ ඔබට උපකාර කරයි. ඔබගේ ජීවිතයට අවශ්‍ය සියලුම අවශ්‍යතා උන්වහන්සේ සපයයි. දෙවියන්වහන්සේගේ දෑතින් අපට ලබෙන්නාවූ ආශිර්වාදයන් ඉතාම අලංකාරයි. අනර්ඝයි. එම නිසා දෙවියන්වහන්සේගේ රාජ්‍යයත් උන්වහන්සේගේ ධර්මිශ්ඨකමත් සෙවීමට අපගේ අභිලාශය තව තවත් වැඩි කල යුතුයි.

## සභාව තුල එක්සිත්ව ඔබ රැස්වෙන්න

මේ කාලයේදී බොහෝ කිතුණුවන් සභාවට යාමත් අප සමඟ එකතු වී නමස්කාර කිරීමටත් බොහෝ අපහසු කරයි. ඔවුන් ඔවුන්ගේ සභාවටත් සභාවේ අය සමඟත් නිසි බැඳීමත් නැති බව ඔවුන් ප්‍රකාශ කරයි. අද බොහෝ දෙනා රූපවාහිනිය, YouTube හරහා විකාශනය වන දේශනා වලට ඇහුම්කන් දෙමින් සභාවට යාම නතර කර තිබේ. ඔබට සභාවක් හා සභා පාලකවරයෙක් දී තිබෙන්නේ දෙවියන්වහන්සේම බව අමතක නොකරන්න.

(i). හැම ඇදහිලිවන්තයෙක්ම හොඳ පාලකවරයෙක් හා හොඳ සභාවක් තෝරා ගෙන නිතරම නමස්කාරයට යා යුතුයි.

(ii). ඔවුන් තමාට දුන් එඬේරා සමඟ එකතු වී සභාවේ සියලු සේවාවල හා ක්‍රියාකාරකම් වලට සහභාගී විය යුතුයි.

(iii). ඔවුන්ගේ මුළු හදවතින්ම ස්වාමීන්වහන්සේට සේවය කරමින් තමාගේ පාලකතුමාටත් සභාවටත් අවංකව ජීවත් විය යුතුය.

***''සමහරුන්ගේ පුරුද්ද ලෙස අපේම රැස්වීම් අත්නැර, ඒ දවස ලංවන බව නුඹලාට පෙනෙන ප්‍රකාරයට වඩා එකිනෙකාට අවවාද කරමු.'' (හෙබ්‍රෙව් 10:25) ''ස්වාමීන්වහන්සේගේ ගෘහයෙහි හිඳුවනලද්දෝ අපේ දෙවියන්වහන්සේගේ මිදුල්වල සඵලවන්නෝය.'' (ගීතාවලිය 92:13)***

## (3). අභිලාශය ඇති පුද්ගලයා දෙවියන්වහන්සේගේ අරමුණ ඉෂ්ඨකරයි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මේ ලෝකය තුළ ජීවත් වූ කල්හි අරමුණක් ඇති ජීවිතයක් ගතකලේය. බොහෝ දෙනා උන්වහන්සේව අනුගමනය කරනු ලැබුයේ, බොහෝ දේ බලාපොරොත්තුවෙන්ය. උන්වහන්සේ බොහෝ කාර්‍යබහුලව සිටිනු ලැබුවත් දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව එවන ලද අරමුණ ඉටු කිරීමට උන්වහන්සේව ඉතා අවධානයෙන් සිටියේය. ***''යේසුස්වහන්සේද, මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ඨ කිරීමය.'' (යොහාන් 4:34)***

යේසුස්වහන්සේට උන්වහන්සේගේ ජීවිතය තුළ බොහෝ බාධා හා විරෝධතාවයන් වලට මුහුණදීමට සිදු විය. උන්වහන්සේගේ ජීවිතය තුළින් දෙවියන්වහන්සේ බලාපොරොත්තු වූ අරමුණ ඉෂ්ඨකරන පිණිස, ***''ඔවුන්ගේ ඇදහිලි නැතිකම නිසා...'' (යොහාන් 13:58) ''උන්වහන්සේ ස්වකීය ස්ථාන වලට ආ සේක. ස්වකීයයෝ උන්වහන්සේ පිළිනොගත්තෝය.'' (යොහාන් 1:11) ''...ඔවුන්ගේ සීමාවලින් අහක්ව යනු ලෙස උන්වහන්සේගෙන් ඉල්ලුවෝය.'' (මතෙව් 8:34) ''මොහු වඩුවාගේ පුත්‍රයා නොවේද?...'' (මතෙව් 13:55) ''ඔවුන් මෙසේ ඇසුවේ උන්වහන්සේ පරීක්ෂාකරමින් උන්වහන්සේට වරද තබන්ට කාරණයක් ලබන පිණිසය...'' (යොහාන් 8:6) ''...නුමුත් ඔහු යේසුස්වහන්සේට තළවා...'' (මතෙව් 27:26) ''උන්වහන්සේට කෙළගසා...'' (මාර්ක් 15:19) ''ඔව්හු උන්වහන්සේව කුරුසියෙහි ඇණගසා මැරුවෝය...'' (මාර්ක් 15:24)***

උන්වහන්සේ මෙවැනි තිත්ත අත්දැකීම් පැමිණුනත් උන්වහන්සේගේ ජීවිතයෙහි තිබූ අරමුණ උන්වහන්සේගේ අත් හැරියේ නැත. උන්වහන්සේගේ කැමැත්ත හා අභිලාෂය වූයේ තම පියාණන්වහන්සේගේ කැමැත්ත ඉෂ්ඨකිරීමයි.

ප්‍රිය දෙවියන්වහන්සේ ගේ දරුවෙනි, ඔබගේ ජීවිතය තුළ ඔබගේ අභිලාශය කුමක්ද? ඔබට දෙවියන්වහන්සේව ප්‍රිය කිරීමට අවශ්‍ය නම්, දෙවියන්වහන්සේගේ මෙම සැලැස්ම ඉෂ්ඨ කිරීමට ඔබ ඉතාම ශක්තිමත්ව සිටිය යුතුයි. සැබැවින්ම ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

## (4). අභිලාශයක් ඇති පුද්ගලයෝ ඔවුන්ගේ වැජය සම්පූර්ණ කරයි.

*"ඔබ මට දුන් වැඩ මම නිමකර පොළොවේදී ඔබ ගෞරවයට පැමිණෙවීමි." (යොහාන් 17:4)* යේසුස්වහන්සේ මෙලෙස යාඥාවක් කිරීම තුල අපට පෙනෙන්නාවූ දෙය නම්, අපත් අපට දුන් වැඩය සම්පූර්ණ කල යුතු බවයි. ශුද්ධවූ පාවුලුතුමා මෙසේ පවසයි. *"දැන් ඉතින් ආත්මයෙන් බඳිනු ලැබ, මම යෙරුසෙලමට දුක්ද මට පැමිණේයයි ශුද්ධාත්මයාණන්වහන්සේ සියලු නුවරවලදී සාක්ෂි දෙනසේක. නුමුත් මාගේ දිවීමද දෙවියන්වහන්සේ ගේ කරුණාවේ ශුභාරංචියට සාක්ෂි දෙන පිණිස ස්වාමිවූ යේසුස්වහන්සේගෙන් මට ලැබුණු මෙහෙයද සම්පූර්ණ කිරීම පමණ මාගේ ජීවිතය වැදගත්ය. නොහොත් මටම අගේය කියා මම කිසිසේත් නොසලකමි." (ක්‍රියා 20:20-24)*

යේසුස්වහන්සේගෙන් තමා ලබාගත් සේවය සම්පූර්ණ කර නිමාකිරීමට කැමති බව පාවුලුතුමා පවසයි.

මෙවැනි සේවයක් ස්වාමීන්වහන්සේ අප අතට දී ඇත. උන්වහන්සේ සෑම කෙනෙක්වම කැඳවා ඇත්තේ යම්කිසි සැලසුමක් හා අරමුණක් ඇතිවයි. යම් කෙනෙක්ව අන්ධකාරය තුළින් ආලෝකය වෙතට ගෙන ආ විටදී ස්වාමීන්වහන්සේ ඔහුට යම්කිසි වගකීමක්, වැඩක් පවරන අතර ඔහු එය වගකීමකින් යුතුව නිමා කරයි කියා උන්වහන්සේ බලාපොරොත්තු වෙයි. අප සියලුදෙනාම අවසානය දක්වාම ගමන්කල යුතුයි. බොහෝ දෙනෙක් අද බොහෝ සැලසුම් තනි තනිවම ආරම්භකරන අතර නොයෙකුත් ප්‍රශ්න හා කරදර පැමිණෙන කල්හි ඔවුන් තනිවෙනු ඇත. ඔබට දර්ශනයක් තිබේ නම්, ඔබ ඒ තුළ ස්ථිරව සිටිය යුතුයි. ඔබත් ඔබගේ ජීවිතයට වඩා ඔබගේ දර්ශනය ඉටු කිරීමට අභිලාශයක් ඇති පුද්ගලයෙකු වන්න අභිලාශය ඇති පුද්ගලයෙකු ඔහුගේ අභිලාශය ඉටු කරන තුරු මරණයටවත් භය නොවන්නේය.

අද මා මෙම කාරණාව ගැන දේශනා කරන විට මා හට ඇහුම්කන් දෙන පුද්ගලයින් 'සහෝදර සෑම්ට මොන ප්‍රශ්න තිබෙනවාද?' කියා සිතන්නට පුළුවනි. මී වසර 54 කට පෙර දී මගේ දර්ශනය හා අභිලාශය ඉටු කිරීමට මා කොතරම් මිලයක් ගෙව්වාද කියාත් අහන්න අප්‍රමාණ බොහෝ පීඩා, ප්‍රශ්න, කරදර, ආර්ථික ප්‍රශ්න හා ශාරීරික දුර්වලතා වලට මුහුණ දුන්නාද කියාත් මා දනිමි. මගේම සෙනඟ මගේම මිතුරන් මා හට ප්‍රශ්න කරදර පැමිණි කල්හි මගෙන් ඈත් විය. සමහර අය දෙවියන්වහන්සේ තුළට යාමට මා හට විශාල බාධාවක් වූ අතර අදටත් ඔවුන් මට බාධාවක්ව ඇත. නමුත් මා මගේ ඇදහිල්ල තුළ ශක්තිමත්ව සිටියෙමි. *"මා බලවත් කරන්නාවූ තැනැන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන" (පිලිප්පි 4:13) "මම විශ්වාසයෙකැයි ගණන්ගෙන තමන්වහන්සේගේ සේවයට අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මා පත්කල බැවින් මට බලය දුන්නාවූ උන්වහන්සේට ස්තුති කරමි." (2 තිමෝති 1:12) "උන්වහන්සේ මා මරා දැමුවත් මා උන්වහන්සේ කෙරෙහි විශ්වාසය කරමි." (යෝබ් 13:15)*

මාගේ ප්‍රිය සහෝදර සහෝදරිය, මාගේ අභිලාශය හා මාගේ අරමුණ තුළ මා ස්ථිරව සිටිමි. ඔබත් ඔබගේ අරමුණ තුළ ස්ථිරව සිටින්න. පාවුලුතුමාට ඔහුගේ ජීවිතයෙහි පීඩාවන් හා දන්වැල් යෙරුසෙලමෙහි තිබෙන බව දැනගෙන සිටි මුත් ඔහු එම කැඳවීම තුළ නතරවූයේ නැත. ඔහු තිමතිට මෙසේ ලියනු ලබයි. *"මම යහපත් යුද්ධයෙහි යුද්ධ කලෙමි. මම දිවීම කෙළවරකලෙමි." (2 තිමෝති 4:7)* අපට මේ දිවීම දුවන පිණිසත් දෙවියන්වහන්සේ උපකාර කරයි. අපට දී තිබෙන තලෙන්ත හා දීමනා උන්වහන්සේ උදෙසා පාවිච්චි කිරීමට ඔබට පුළුවනි. මාගේ දිවීම මා

*9 වෙනි පිටුවට ...*

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, **Post Box 2957**, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

"...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

# පොත් හා සඟරා ප්‍රකාශන දර්ශනය ඉදිරියට ගෙනයාම


## PROGRESS OF MY VISION IN PUBLICATIONS!



Dr. N. Jeevanandam



Rev. S. Devadasan



Registered with the Registrar of News Paper
For India under R.N.I. 11967/'67

வருட சந்தா ரூ.1/-

வருகையின் தூதன்

Those who turn the world upside down. Acts.17:6.

Vol. 68 கர்த்தாவே, நியாயத்தை கேட்டருளும், என் கூப்பிடுதலைக் கவனியும், சங்.17:1 செப்டம்பர் 2022 No.9

මගේ පාසල් කාලයේ සිටම මා පොත් පත් කියවීමට ඉතාම ආශාවක් දැක්වූයෙමි. ඒ කාලය තුල තිබූ ඉතාම ප්‍රසිද්ධ සඟරාව වන 'මග්ලිච්' සඟරාව ජීවනාදම් නැමති දේව දාසයෙක් තුළින් නිකුත් කරනු ලැබුවේය. එසේම 'පෙරමඟ දූතයා නැමති සඟරාව දේවගැති දේව දාසන් විසින් නිකුත් කෙරුණි. මෙම සඟරාවන් දෙකම මගේ පුද්ගලික ජීවිතයට මහත් බලවත් ආශිර්වාදයක් වූවේය. මගේ මුළු හදවත තුලින් දෙවියන්වහන්සේ මට ලබා දුන්නාවූ දේවල සහ ස්වර්ගීය කාරනාවන් සම්බන්ධව සටහන් කොට සඟරාවක් මුද්‍රණය කර



බෙදා හැරීමට මාගේ හදවත තුළ බලවත් ආශාවක් තිබුනත් ඒ දෙය කරගැනීමට පිනිස අවශ්‍ය මුදල් මා සතුව නොතිබුණි. ඒ නිසා මගේ හදවතේ තිබුණාවූ ආශාව මා යටපත් කරගත්තෙමි.




Mr. M. Munusami

නමුත් මට ලැබුණාවූ එළිදරව්ව සහ මගේ ජීවිත අත්දැකීම් සියල්ල ලිවීමට මා ආරම්භ කල පසුව ඒ ලියූ සියල්ල මත මගේ අත තබා යම් දිනකදී දෙවියන්වහන්සේ මේවා මුද්‍රණය කර බෙදා හැරීමට උපකාර කරයි කියා විශ්වාස කලෙමි. තවද මා ලියූ සියලුම සටහන් මා මගේ කාමරයෙහි ගොඩ ගැසීමට පටන්ගත්තෙමි. ඒවා දකින මා මහත් කනස්සල්ලට පත්වූයෙමි. මට ලැබුණාවූ මුදල් සියල්ලම පෑන්, තීන්ත හා ලිවීමට අවශය කඩදාසි පත්‍ර ලබා ගැනීමට වියදම කලෙමි.

තවද දෙවියන්වහන්සේගෙන් මට ලැබුණාවූ සියලු පණිවිඩ මේ ආකාරයෙන් පිළිවෙලම ලියා අන් අයට බෙදා දුන්නෙමි. මේවා කියවූ අය එය ඉතා අගය කලේය. මෙසේ මාස ගණනාවක් ගත වූ පසු මා හට යතුරු ලියනයක් ලැබුනු අතර මා එයින් දෙවියන්වහන්සේගෙන් ලැබුණාවූ පණිවිඩ ටයිප් කර ඒ කාලයේ තිබූ රෝනියෝ යන්ත්‍රයක් මඟින් ඒවා මුද්‍රණය කර ඒ සියල්ල මගේ කර




Echo of His Call Magazines in 16 languages



Pr. Sam with his daughter Angeline carried magazines for distribution

පිට තබාගෙන සියලු දෙනාටම බෙදා දීමට පටන්ගත්තෙමි. පසුව මා මුදල් ගෙවා පත්‍රිකා මුද්‍රණය කර බෙදා දීම ආරම්භ කලෙමි. මගේ කිතුණු නොවන මිත්‍රයෙක් වූ එම්. මුනුසාමි මගේ මෙම පත්‍රය මුද්‍රණය කිරීමට බොහෝ ලෙස උපකාර කලේය. මා මේ සියල්ල දිගටම කරගෙන ගියෙමි. ඉන්පසුව මගේම කියා මුද්‍රණාලයක් ආරම්භ කලෙමි. පළමුව මා කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දෙමළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් එකම පත්‍රයක මුද්‍රණය කර බෙදා දීමට පටන්ගත්තෙමි. ඊට ටික කාලයකට පසුව ඉංග්‍රීසි හා දෙමළ භාෂා වලින් වෙන වෙනම මෙම සඟරාව මුද්‍රණය කලෙමි. අදද මෙම සඟරාව සෑම මසකම දෙමළ, ඉංග්‍රීසි, සිංහල, මලයාලම්, ඇෆ්‍රිකානාස්, තෙලිඟු, හින්දි, කණ්නඩා, මරාති, අසාමි, බෙංගාලි, උර්දු, නේපාලි, ගජරාති ඔඩිසා සහ පංජාබි යන භාෂාවන් වලින් මුද්‍රණය කර බෙදා හරින්නෙමු. අද මෙය භාෂා 16 කින් ලියාපදිංචි වූ පුවත්පත් ලෙස මුද්‍රණය කර බෙදා හරිමු. මෙම සියලු භාෂාවෙන්ගෙන් නිකුත් කරන්නාවූ සඟරාවන් ඉන්දියානු ආණ්ඩුවේ ලියාපදිංචි කර ඇත්තෙමු. මේ කාලයේදී මා ළඟ තිබූ බයිසිකලය සහ යතුරු පැදියෙහි මගේ දුව වන ඇන්ජලින් සෙල්ව කුමාරිවද තබාගෙන ගොස් මේවා බොහෝ ස්ථාන වලට බෙදා හැරියෙමි. මා දැන් මාස්පතා මෙම සඟරාව දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් ලියන විටදී, මෙය අනෙකුත් භාෂාවෙන්ට පරිවර්තනය කර නිකුත් කිරීමට දෙවියන්වහන්සේ උපකාර කර තිබේ. මෙම සඟරාව වෙනත් භාෂාවන් වලට පරිවර්තනය කිරීමට අපට උපකාර කරන්නාවූ අය උදෙසා යාච්ඤා කරන්න.

සහෝදරී සෙරිනා බෙවින්, දේවගැති කේ. ආර්. රාජසේකරන්, දේවගැති ඒ. රිච්ඩ් සැමුවෙල්, දේවගැති ස්ටීවන් ජෝෂප්, සහෝදර ජයරත්නද සොයිසා, සහෝදරී මංජුලා වීරබාහු, සහෝදරී රේණුකා රාජපක්ෂ, සහෝදර බෙන්ජමින් මෝසෙස්, සහෝදර මොහාන් කුමාර්, සහෝදර නෙල්සන්, සහෝදර එන්. මොහාන් බාබූ, සහෝදරී ඩොරීති එස්. තෝමස්, දේවගැති ආර්. රාමක්‍රිෂ්ණා, දේවගැති ශෂි තිවාර, දේවගැති යෝෂුවා රාජ්, සහෝදරී බොනාලි තෂ රාජ්, දේවගැති අංජන් කුමාර් සිං, සහෝදර ඉන්ද්‍රජිත් රෝයි, සහෝදර සෙවින්ද කුමාර්, සහෝදර බෙවන් දේව්කෙට්ටා, සහෝදර රාජකුමාර් බණ්ඩාර, සහෝදර පන්කාජ් සී වාඩියා, සහෝදරී ස්වර්ණා සැමුවෙල්, සහෝදර අශීෂ් රමේෂ් බල්හාරි, සහෝදර එම්. ප්‍රකාසම්, සහෝදරී සීතා ගුරුස්වාමි, සහෝදරී ඩේඩි රාණි, සහෝදරී එස්. තිරුමගල්, සහෝදර ජෝන් රොද්‍රිගෝ, සහෝදර ඩී. ඇන්තනි රාජ්, සහෝදර ඩී. ජේ. ජෝෂප්, සහෝදරී විසාලච්චි, සහෝදර එම්. මනී, සහෝදර කේ. ඉන්ද්‍රේෂ් කුමාර්, සහෝදර එල්. මොහාන්, සහෝදර ආර්. එම්මෑනුවෙල් පෝල් සහ සහෝදර ආර්. විජේ යන මේ අය මා හට ලබාදුන් නිසා ස්තුති වන්ත වෙමි. මෙය මාගේ ඇස් ඉදිරියෙහි අනර්ඝවූ දෙයකි. ''***මේක ස්වාමීන්ගේ ක්‍රියාවය. එය අපේ ඇසට ආශ්චර්යමත්ය.***'' ***(ගීතාවලිය 118:23)***

''***...උන්වහන්සේ දුප්පතා ධූලියෙන් නැගුටුවන සේක. දිළින්දා, කසළ ගොඩින් ඔසවනසේක...***'' ***(1 සාමුවෙල් 2:8)***

■ ■ ■

*7 පිටුවෙන්....* කෙළවර කල බවත් මට දුන් සේවය මා ඉතා හොඳින් සම්පූර්ණ කලේය කියාත් දිනකදී ඔබට පැවසීමට හැකිය.

## (5). අභිලාශයක් ඇති පුද්ගලයාගේ ඉලක්කය ස්වර්ගරාජ්‍යයෙහිය.

පිලිප්පි 3:13-14 හි පාවලු තුමා මෙසේ පවසයි. අප සෑම කෙනෙකුටම ආත්මික ඉලක්කයක් තිබිය යුතුය. මෙම ඉලක්කය දෙස බලමින් ගොස් එම ඉලක්කය අත්පත් කරන්නාවූ පුද්ගලයාට දෙවියන්වහන්සේගෙන් විපාකයක් තිබේ. අපගේ ඉලක්කය කුමක් විය යුතුද? දෙවියන්වහන්සේගේ

RNI NO. TN/SIH/2006/17846

ස්වර්ග රාජ්‍ය හැර ජීවිතයේ සියලුම කාරණාවන් මෙම ඉලක්කය මත තබමින් ක්‍රියා කරන විටදී දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරයි. නමුත් අපගේ ඉලක්කය ලෝකයේ කාරණාවන් හා ලෝකය සම්බන්ධ දේ පමණක්ම වුවහොත් සැබවින්ම අප පරාජිතය. ලෝකය පසුවට තබා කුරුසිය ඉදිරියට තබා ස්වර්ග රාජ්‍යය කෙරෙහි අපගේ ඉලක්කය තබා අපගේ මේ ජීවන ගමන ගමන්කරමු. යේසුස්වහන්සේව නොදන්නාවූ අයට අප උන්වහන්සේ ගැන ප්‍රකාශකර මේ ස්වර්ග රාජ්‍යය කරා ඔවුන්වද යොමු කරමු. අපගේ ඉලක්කය ස්වර්ගය කෙරෙහි වේවා, අපගේ අභිලාශය ස්වර්ගය වේවා, මේ දේ කරා අපි ගමන් කරමු.

************

## කැඳවීමේ ප්‍රතිරාවය

සැම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India**
**under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 3rd **OCTOBER 2022.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**